නිපුණතාව 2 - ඉල්ලුම,සැපයුම,නම්‍යතාව හා වෙළෙඳපොල සමතුලිතය සමතුලිතය විශ්ලේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.6 - ආදායම් ඉල්ලුම් නම්‍යතාව අනුව තාර්කිකව තීරණ ගන්නා අයුරු විමසයි.

<u>ආදායම් ඉල්ලුම් නම්‍යතාව -</u>

ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී,පාරිභෝගික ආදායම් ප්‍රතිශත වෙනසකට සාපේක්ෂව සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රතිශතක වෙනස මැන දැක්වීමයි.

ආදායම් ඉල්ලුම් නම්‍යතාව = <u>සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රතිශතක වෙනස</u>

ආදායමේ ප්‍රතිශතක වෙනස

1.පහත සඳහන් භාණ්ඩ වර්ග සඳහා ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ අගය පිළිබඳව පැහැදිලි කරන්න.

1.සාමාන්‍ය භාණ්ඩ

2.සුඛෝපභෝගී භාණ්ඩ

3.අත්‍යවශ්‍ය භාණ්ඩ

4.බාල භාණ්ඩ

2.ආර්ථික විග්‍රහයන් සඳහා ආදායම් ඉල්ලුම් නම්‍යතාව යොදා ගත හැකි ආකාර මොනවාද?